# <u>ප්‍රසම්පාදන දැන්වීමයි</u>

2024 වර්ෂය සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයත් කාර්යාල ගොඩනැගිලි හා ගෙවත්ත පිරිසිදු කිරීම සඳහා මිල ගණන් කැඳවීම.

ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයත් කාර්යාල ගොඩනැගිලි හා ගෙවත්ත පිරිසිදු කිරීමේ සේවා සැපයීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පලපුරුදු ආයතන වලින් මිල ගණන් කැඳවනු ලැබේ.

02. මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍ර වල පමණකි. ප්‍රසම්පාදන ලියවිලි ඉල්ලුම් කරන ආයතන පිරිසිදු කිරීමේ සේවා සැපයීම පිළිබඳව අවම වශයෙන් අවුරුදු තුනක පළපුරුද්දක් තිබිය යුතු වේ. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් හා ආපසු නොගෙවනු ලබන රු. 1,000/= ක ගාස්තුවක් අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා ලබා ගත් රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසු සාමාන්‍ය කාර්යාල දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ගිණුම් අංශයෙන් ප්‍රසම්පාදන ලියවිලි ලබා ගත හැක.

03. ප්‍රසම්පාදන ලියවිලි 2023.11.30 වන දින ප.ව. 3.00 දක්වා නිකුත් කරනු ලැබේ.

04. නිසි පරිදි සකස් කරන ලද ප්‍රසම්පාදන ලියවිලි මුද්‍රා තබා 2023.12.01 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ,

සභාපති<br>
ප්‍රසම්පාදන කමිටුව<br>
ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>
ඇසිදිසි මැදුර<br>
නො. 163, කිරුළපන මාවත<br>
පොල්හේන්ගොඩ<br>
කොළඹ 05

යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය හැකිය. එසේ නැතිනම් අතින් රැගෙනවිත් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසු බාර ගැනීම 2023.12.01 වන දින ප.ව. 2.00 ට අවසන් කරන අතර අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරු හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

06. ප්‍රසම්පාදන ලියවිලි ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ දී නොමිලේ පරීක්ෂා කළ හැකිය.

07. වැඩි විස්තර සඳහා දුරකතන අංක 011-2513464 මගින් ප්‍රධාන ගණකාධිකාරී ඇමතීමෙන් ලබා ගත හැක.

සභාපති<br>
ප්‍රසම්පාදන කමිටුව<br>
ජනමාධ්‍ය අමාත්‍යාංශය